ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025-09-24

පැමිණිලි පාර්ශවය : ආර්. එච්. ජී. වසන්ති වික්‍රමරත්ත මිය,
173/ 6/D ,
චාර්ලිස් ගුරුගේ මාවත ,
කැන්දලියද්ද පාලුව ,
ගණේමුල්ල.

වගඋත්තරකාර පාර්ශවය : ඒ. ඩී .එස්. සදීකා මිය,
ලේකම් ,
පළාත් පාලන අමාත්‍යාංශය( බ. ප),
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**පැමිණිල්ල අංකය : HRC -230-24**

**පැමිණිල්ලෙහි කරුණු දැක්වීම**

උක්ත නම් සදහන් පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ඉහත අංක හා දරන පැමිණිල්ල හා බැදේ .

එකී පැමිණිල්ලට අනුව පැමිණිලිකාර ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි 2019. 03 .12 දින සිට 2024 .01. 31 වන දින දක්වා සේවයේ නිරත වූ බවත්, එම සේවා ස්ථානයට ප්‍රථම බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල කාර්යය ක්‍රියාත්මක නිලධාරිනිය වශයෙන් ද සේවය කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එම සේවා කාලයේ දී පැමිණිලිකාරිය වෙත මල්වාන මුස්ලිම් සුසාන භූමියක් සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත අංක CWMP/ADM23/07/31 හා 2022 .11 .02 වන දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය වෙත දන්වා ඇත.

ඒ අනුව මෙම ක්‍රියාව සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බවට ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම් ,පළාත් පාලන අමාත්‍යාංශය , බස්නාහිර පළාත අංක CWMP/ADM23/07/31 හා 2023 .03 .22 වන දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය වෙත දන්වා ඇත .ඉන් අනතුරුව එවක සිටි හරින් ප්‍රනාන්දු පාර්ලිමේන්තු මන්ත්‍රී ,වත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති , සංචාරක හා ඉඩම් අමාත්‍යාගේ චුවමනාවක් මත පැමිණිලිකාරිය වෙත ස්ථානමාරුවීමක් ලබා දී , එම තනතුර සඳහා වෙනත් ලේකම්වරයෙකු වත්තල ප්‍රාදේශීය සභාව වෙත නොපමවා අනියුක්ත කරන ලෙස සඳහන් කරමින් හරින් ප්‍රනාන්දු අමාත්‍ය විසින් ඒ. ඩී .එස්. සදීකා මිය , පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් වෙත 2023. 10 .09 දිනැති ලිපියක් යොමු කර ඇති බව සඳහන් කර ඇත.

ඒ අනුව එම ලිපිය මත පදනම්ව ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023 . 12.04 දිනැති ලිපිය මගින් සේවා අවශ්‍යතාවයක් යනුවෙන් සඳහන් කරමින් පැමිණිලිකාරිය කොළඹ මහා නගර සභාවේ පරිපාලන නිලධාරී තනතුර වෙත ස්ථාන මාරු කරන බව දන්වා ඇත .

නමුත් ඒ වන විට පැමිණිලිකාරිය වයස අවුරුදු 58 ක් ඉක්මවා සිටි නිලධාරියෙකු බවත්, තමන් වසර 1 ½ කින් විශ්‍රාම ගැනීමට සිටි බවත්, 2024 වර්ෂයේ බස්නාහිර පළාත් වාර්ෂික ස්ථාන මාරුකිරීම් අංක 2384/44 දරන ගැසට් නිවේදනයේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති වලට අනුව සහ ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව වයස අවුරුදු 58ක් ඉක්ම වූ නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රිකයෙන් තුළ වුවද මාරු නොකළ යුතු බව සඳහන් කර ඇති බවයි . එසේ තිබිය දී බස්නාහිර පළාත් කාර්ය පටිපාටික රීති ද නොසලකා හැර හරින් ප්‍රනාන්දු අමාත්‍යගේ චුවමනාවක් මත පැමිණිකාරිය තම දිස්ත්‍රිකයෙන් පිටත සේවා ස්ථානයක් වන කොළඹ මහ නගර සභාව වෙත ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය විසින් සේවා අවශ්‍යතාවයක් යනුවෙන් සඳහන් කරමින් 2023 .12. 04 දිනැතිව ස්ථාන මාරු කර ඇත .

පැමිණිලිකාරිය ඉහත ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් කරුණු විමසා ඇති බවත් ,එහිදි පැමිණිලිකාරිය එම ආයතනයේ සිටියදි විනය පරීක්ෂණය ක්‍රියාත්මක කර නොකල හැකි බැවින් පැමිණිලිකාරියව සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීම සිදු කර ඇති බව සඳහන් කර ඇත . එසේ නමුත් පැමිණිලිකාරිය වෙත යොමු කර ඇති ඒ .ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය ,බස්නාහිර පළාතගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023.12.04 දිනැති ස්ථාන මාරු කිරීම් ලිපියෙහි මූලික

විමර්ශනයට යටත්ව සේවා අවශ්‍යතාවයක් යනුවෙන් ස්ථාන මාරු සිදු කර ඇති බව සඳහන් කර නොමැත .

එබැවින් මෙම ස්ථානමාරු කිරීම ඉහතින් සඳහන් කර ඇති පරිදි එවක සිටි හරීන් ප්‍රනාන්දු අමාත්‍යතුමාගේ 2023 .03 .09 දිනැති ලිපියට අනුව එතුමාගේ වුවමනාවක් මත පැමිණිලිකාරිය වෙත වෙනත් සේවා ස්ථානයක් සඳහා ස්ථානමාරුවක් ලබා දී එම තනතුර සඳහා වෙනත් ලේකම්වරයෙකු අනුයුක්ත කර දෙන කරන ලෙස ඒ. ඩී .එස්. සදීකා මිය - පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඉල්ලීම මත පදනම්ව සිදු කර කටයුක්තක් බවත්, ඒ අනුව පළාත් පාලන ලේකම් විසින් පැමිණිලිකාරිය වෙත විධිමත් විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සේවා ස්ථාන මාරු කිරීම සිදු කරන බවට කරුණු දක්වමින් කොළඹ මහා නගර සභාව වෙත ස්ථාන මාරු කර ඇති බවයි.

මෙම ක්‍රියාව සම්බන්ධයෙන් පැමිණිලිකාරිය 2023 .12 .07 වන දිනැතිව එවක ආණ්ඩුකාර , බස්නාහිර පළාත වෙත අභියාචනයක් යොමු කර ඇති බවත්, පැමිණිලිකාරියහට තම සේවා ස්ථානය වන වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි වැඩභාර දී විධිමත් පරිදි සේවයෙන් නිදහස් වී නව සේවා ස්ථානය වන කොළඹ මහ නගර සභාවෙහි රාජකාරි කටයුතු භාර ගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් වෙනත් නිලධාරියෙකු අනුයුක්ත නොකර සිටි බැවින් පැමිණිලිකාරිය වත්තල ප්‍රාදේශීය සභාවේම 2024 .02 .12 දින තෙක් රාජකාරි කටයුතු සිදු කිරීමට සිදු වූ බව සඳහන් කර ඇත.

එවන් පසුබිමක හරීන් ප්‍රනාන්දු අමාත්‍යතුමන්ගේ අනුගාමික ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු විසින් පැමිණිලිකාරිය නව සේවා ස්ථානය වන කොළඹ මහ නගර සභාවේ රාජකාරී කටයුතු භාර ගැනීමට ද පෙර වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා නවක නිලධාරියෙකු වෙත වැඩ භාර දී සිටි බවත් , එයින් පැමිණිලිකාරිය කළකිරීමකට සහ මානසික පීඩනයකට ලක් වූ බවත් , තම විශ්‍රාම වැටුප අහිමි වේ යැයි ඇති වූ බිය නිසා ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව වෙත සේවා ස්ථාන මාරු කරන ලෙස පැමිණිලිකාරිය විසින් ඉල්ලීමක් සිදු කර ඇති බව සඳහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය වෙත 2024 . 02. 22 වන දින ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව වෙත ස්ථානමාරු කිරීම් ලිපියක් ලැබුනු බවත් , පැමිණිලිකාරිය එදිනම ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව ලේකම් තනතුරෙහි වැඩභාර ගත් බවයි. මෙලෙස 2024 .05 .18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2384/44 දරන ගැසට් පත්‍රය මගින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරුකිරීම කාර්ය පටිපාටික රීති ද ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති නොසලකා ඒ . ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් එවක හරීන් ප්‍රනාන්දු පාර්ලිමේන්තු මන්ත්‍රී ,වත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති , සංචාරක හා ඉඩම් අමාත්‍යයගේ වුවමනාවක් මත විනය පරීක්ෂණයක් යනුවෙන් යැයි දක්වමින් පැමිණිලිකාරියගේ තම දිස්ත්‍රිකයෙන් පිටත වෙනත් සේවා ස්ථානයක් සඳහා ස්ථානමාරු කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම

කඩ වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති පැමිණිල්ලෙහි සඳහන් කර ඇත . එබැවින් පැමිණිල්ලෙහි අපේක්ෂිත සහනය ලෙස පැමිණිලිකාරිය විශ්‍රාම ගත වීමට ආසන්න බැවින් දේශපාලික මැදිහත්වීම් මත ලබා දී ඇති මෙම සේවා ස්ථාන මාරුකිරීම අවලංගුකර නැවත වත්තල ප්‍රාදේශීය සභාව වෙත ස්ථානමාරු කරන මෙන් ඉල්ලා සිටියි .

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවයේම සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රධාන කාර්යාලයේ දී 2025. 06 .24 දින සහ 2025 .07. 30 වන දින පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. වගඋත්තරකාර පාර්ශවය වන බස්නාහිර පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් වෙනුවෙන් ජී. එස්. අයි විමලසේන මිය - ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් සහ එම් .ඒ. ඩී .ටී .ආර් මාරසිංහ - පරිපාලන නිලධාරී සහභාගි වී ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් පැමිණිලිකාරිගේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා වෙත සහ අමාත්‍යශය ලේකම්තුමිය වෙත පැමිණිලි ලැබී ඇති බව සඳහන් කර ඇත. එම පැමිණිලිවලට අනුව මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරන බවට ඒ. ඩී. එස්. සදිකා මිය - ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත අංකCMWP/ADM23/7/31 හා 2023. 03. 22 දිනැති ලිපිය පැමිණිලිකාරිය වෙත දන්වා ඇති බව සඳහන් කර ඇත.

තවද මෙම විධිමත් විනය පරීක්ෂණය සඳහා පැමිණිලිකාරිය එම සේවා ස්ථානයේ රාජකාරි සිදු කරමින් සිටිය දී ක්‍රියාත්මක කිරීම බාධාවක් සිදු වෙතැයි අපේක්ෂාවෙන් සහ එම නිලධාරිනිය විධිමත් පරීක්ෂණයෙන් අගතියකට පත් නොකිරීම අපේක්ෂාවෙන් සිදු කිරීම සඳහා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ XVI වැනි පරිච්ඡේදය අනුව මෙම සේවා මාරුකිරීම සිදු කර ඇති බව සඳහන් කර ඇත .

එබැවින් මෙම පැමිණිලිකාරිය වයස අවුරුදු 58 ක් ඉක්මවා සිටිය ද බස්නාහිර පළාත් සභාව තුල ඒ වන විට කළමනාකරණ සේවයේ අධිශ්‍රේණියේ පුරප්පාඩු වැඩි වශයෙන් පැවති කොළඹ මහ නගර සභාව වෙත පරිපාලන නිලධාරී ලෙස 2023.12.04 දිනැතිව සේවා අවශ්‍යතාවයක් යැයි පමණක් දක්වමින් ස්ථානමාරුකිරීම සිදුකර ඇති බවට කරුණු දක්වා ඇත .

නමුත් මෙම පැමිණිලිකාරිය විසින් ඉහතින් සඳහන් කර ඇති සේවා ස්ථානය වෙත වාර්තා නොකර මාස 02 ආසන්න කාලයක් වත්තල ප්‍රාදේශීය සභාවේ සේවය කර ඇති බවත් ,පැමිණිලිකාරිය විසින් වෙනත් සේවා ස්ථානයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව වෙත ස්ථාන මාරුවීමක් ලබා දෙන ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇති බවත් , එම ඉල්ලීම සලකා බලා ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාවේ නාගරික

ලේකම් තනතුරෙහි වැඩ බැලීම සඳහා සේවා ස්ථානය නැවත මාරු කිරීම සිදුකර ඇති බව ද වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

මේ වන විට පැමිණිලිකාරිය වෙත ක්‍රියාත්මක කල 2023. 03 .22 දිනැති විධිමත් විනය පරීක්ෂණයෙන් ඒ. ඩී. එස් සදිකා මිය - ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය , බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM23/7/31 හා 2025 .06.03 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය නිදොස් කොට නිදහස් වී ඇති බව සඳහන් කර ඇත.

තවද මෙම නිලධාරිනිය වෙත වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි සේවයේ නිරත වූ කාලයේ දී සිදුකරනු ලැබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ මූලික විමර්ශනයෙට අදාලව චෝදනා පත්‍රය 2025. 06 .09 දිනැතිව නිකුත් කර ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

එබැවින් පැමිණිලිකාරිය නැවත වත්තල ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරුවීම සිදුකිරීම ලබාදිය නොහැකි බවත් ,එම චෝදනා පත්‍රයේ ද කටයුතු අවසන් වී පැමිණිලිකාරිය අදාල චෝදනාවලින් නිවැරදිකරු වූ විට සහ වත්තල ප්‍රාදේශීය සභාවේ පවතින පුරප්පාඩු අනුව සලකා බලා වත්තල ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරු වීම ලබා දිය හැකි ද යන්න තීරණය කරන බව සඳහන් කර ඇත .

<u>නිරීක්ෂණ</u>

2024 වර්ෂයේ බස්නාහිර පළාත් වාර්ෂික ස්ථාන මාරුකිරීම් අංක 2384/44 දරන ගැසට් නිවේදනයට අනුව , බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක වසර 05ක් සේවා කාලයක් සම්පූර්ණ කරන හා මාරු කිරීම් ක්‍රියාත්මක වන වර්ෂයේ ජනවාරි මස පළමුවෙනිදා වන විට වයස අවුරුදු 57ක් නොඉක්මවූ සෑම නිලධාරියෙක්ම වාර්ෂික ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තියට අනුකූලව හා මෙම රීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සිදුකරන වාර්ෂික ස්ථාන මාරු කිරීමට යටත් නිලධාරියෙකු වන බව සඳහන් කර ඇති බව පෙනී යයි.

තවද ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රිකයෙන් තුළ වුවද මාරු නොකළ යුතුය යන්න සඳහන් කර ඇති බව ද පෙනී යයි.

ඒ අනුව මෙම පැමිණිල්ලෙහි පැමිණිලිකාරිය වන ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය වයස අවුරුදු 58ක් වන බැවින් 57 නොඉක්ම වූ නිලධාරීන් සඳහන් වාර්ෂික ස්ථාන මාරු පටිපාටියට අනුව ස්ථාන මාරු කිරීමට යටත් නොවන බව නිරීක්ෂණය වේ .

පැමිණිලිකාර ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය බියගම ප්‍රාදේශිය සභා බල ප්‍රාදේශයේ මල්වාන මුස්ලිම් සුසාන භූමියක් සඳහා අනුමැතිය ලබාදීමේ දී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා

ගැනීමකින් තොරව කටයුතු නොකිරිම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කරන බව ඒ. ඩී. එස් සදීකා මිය - ලේකම් ,පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත අංක CMWP/ADM23/7/31 හා 2023. 03. 22 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය වෙත දන්වා ඇත .

තවද පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ලෙහි සඳහන් කර ඇති පරිදි හරින් ප්‍රනාන්දු , පාර්ලිමේන්තු මන්ත්‍රී ,වත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති , සංචාරක හා ඉඩම් අමාත්‍ය විසින් ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය ,වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සඳහා ස්ථාන මාරුවක් ලබා දී වත්තල ප්‍රාදේශීය සභාව සඳහා වෙනත් ලේකම්වරයෙකු නොපමාව අනියුක්ත කර දෙන මෙන් සඳහන් කරමින් ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය වෙත 2023. 10 .09 දිනැති ලිපියක් යොමු කර ඇති බව පෙනී යයි. ඉන් අනතුරුව ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය , බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023.12.04 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය සේවා අවශ්‍යතාවය මත යැයි සඳහන් කරමින් වහාම ක්‍රියාත්මක වන පරිදි කොළඹ මහ නගර සභාව වෙත ස්ථාන මාරු කර ඇති බව ද පෙනී යයි.

තවද වගඋත්තරකාර පාර්ශවය සහභාගීත්වයෙන් 2025. 06 .24 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ දී පවත්වන ලද පරීක්ෂනයේ දි , පැමිණිලිකාර ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය වත්තල ප්‍රාදේශීය සභාවේ රාජකාරි සිදු කරමින් සිටිය දී කරුනු ලැබූ ක්‍රියාවක් සම්බන්ධයෙන් පවත්වන විධිමත් විනය පරීක්ෂණයට බාධාවක් සිදු වෙතැයි, අපේක්ෂාවෙන් සහ එම නිලධාරිනිය මෙම විධිමත් පරීක්ෂණයෙන් අගතියකට පත් නොකිරීම අපේක්ෂාවෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ XVI වැනි පරිච්ඡේදය අනුව ස්ථාන මාරුකිරීම් සිදු කර ඇති සඳහන් කර ඇත.

ඒ අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ XVI වැනි පරිච්ඡේදයෙහි 246 වගන්තිය යටතේ මූලික විමර්ශනයක් ආරම්භ කිරීමට පෙරාතුව හෝ මූලික විමර්ශනයක් පවත්වා ගෙන යන අතරතුර අනාවරණය වි ඇති කරුණු මත හෝ උද්ගතව ඇති තත්ත්වයන් මත හෝ කිසියම් නිලධරයකු තවදුරටත් ඔහුගේ තනතුරෙහි හෝ වර්තමාන සේවා ස්ථානයෙහි යෙදවීම මූලික විමර්ශනයට බාධාවක් වන විටෙක ස්ථාන මාරු කළ හැකි බව සඳහන් කර ඇති බව පෙනී යයි .

තවද පළාත් පාලන කොමසාරිස් (වැ. බ) බස්නාහිර පළාත LGD /211/කළ අධි/25/2012-79 අංක හා 2023. 12 .07 දිනැති ලිපියෙහි ස්ථාන මාරුකිරීම සේවා අවශ්‍යතාවයක් යනුවෙන් සඳහන් කර ඇති බව පෙනී ගියද එම ලිපියෙහි මූලික විනය පරීක්ෂණයට යටත්ව සේවා අවශ්‍යතාව සඳහා ස්ථාන මාරුකරන බව සඳහන් කර නොමැති බැවින් , මෙම ස්ථාන මාරු කිරීම විධිමත් පරිදි සිදු කිරීමට පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් කටයුතු කර නොමැති බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

එවන් පසුබිමක පැමිණිලිකාරිය වෙත ඒ .ඩී. එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2023. 12 .07 දිනැති ලිපිය අනුව කොළඹ මහා නගර සභා වෙත ස්ථාන මාරු කිරීම ක්‍රියාත්මක නොකර 2024. 02 .12 වන දින තෙක් වත්තල ප්‍රාදේශිය සභාවේ ලේකම් තනතුරෙහි වැඩ කටයුතු සිදු කර ඇති බව සඳහන් කර ඇති බව පෙනී යයි .

එසේම 2018. 07 .31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2082/7 දරන ගැසට් පත්‍රය මගින් බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන් අධි ශ්‍රේණියේ නිලධාරින් ප්‍රාදේශීය සභාවල ලේකම් තනතුරු වල ස්ථාන ගත කිරීම පළාත් පාලන ආයතන වල පරිපාලන ආයතන වල පරිපාලන නිලධාරී තනතුරු වල ස්ථානගත කිරීම අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව හා ආයතන අතර ස්ථාන මාරු කිරීම හා සේවයෙන් පහ කිරීම හා විනය පාලන කටයුතු වල බලය පළාත් පාලන ලේකම් සතුව ඇති කටයුත්තක් බව පෙනී යයි .

එබැවින් තම සේවා ස්ථානය සඳහා වෙනත් නිලධාරියෙකු අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පලාත් පාලන ලේකම් සතුව ඇති කටයුක්තක් බවත් , පැමිණිලිකාරිය විසින් අදාල පත්වීම් බලධාරියා මගින් යොමු කර ඇති 2023. 12 .07 දිනැති ස්ථාන මාරු කිරීම 2024. 02 .12 වන දින තෙක් එනම් 2 මාස සහ 5 දින යන තෙක් ක්‍රියාත්මක නොකර පෙර සේවා ස්ථානයේම රාජකාරි කටයුතුවල නිරත වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ .

තවද පැමිණිලිකාරිය වත්තල ප්‍රාදේශිය සභාවේ ලේකම් තනතුර සඳහා වෙනත් නිලධාරියෙකු අනුයුක්ත කර පසු ඒ.ඩී.එස්. සදීකා මිය- ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය , බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023 . 12. 04 දිනැති ලිපිය අනුව කොළඹ මහ නගර සභාව වෙත වාර්තා නොකර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත ස්ථාන මාරු කරන ලෙස ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත.

පැමිණිකාරියගේ එම ඉල්ලීම අනුව හා සේවා අවශ්‍යතාව මත වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ පරිපාලන නිලධාරී තනතුරට ස්ථාන මාරු කර ඇති බවත් , නිත්‍ය තනතුරට අමතරව එහි පුරප්පාඩුව පවතින නාගරික ලේකම් (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III) තනතුරෙහි වැඩබැලීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පත්කරන බවටත් ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය අංක CMWP/ADM13/1/02/2024 හා 2024. 02. 22 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බව පෙනී යයි.

කරුණු මෙසේ තිබිය දී මේ වන විට පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් , බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM23/7/13 හා 2025 . 06.03 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය වෙත නිකුත් කරන ලද අංක CMWP/ADM23/7/31 හා 2022 .11.02 දිනැති නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා

සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ අවසන් නිර්දේශය සැලකිල්ලට ගෙන පැමිණිලිකාරිය සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළ බව සඳහන් කර ඇති බව පෙනී යයි .

<u>නිගමනය</u>

එවක හරීන් ප්‍රනාන්දු හිටපු අමාත්‍ය හා පාර්ලිමේන්තු මන්ත්‍රී ,වත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති , සංචාරක හා ඉඩම් අමාත්‍ය විසින් වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය වන පැමිණිලිකාර ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය සඳහා ස්ථාන මාරුවක් ලබා දී , වත්තල ප්‍රාදේශීය සභාව සඳහා වෙනත් ලේකම්වරයෙකු නොපමාව අනියුක්ත කර දෙන මෙන් සඳහන් කරමින් ඒ. ඩී .එස්. සදීකා මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය වෙත 2023. 10 .09 දිනැති ලිපියක් යොමු කර ඇත .

එම ලිපිය මත පදනම්ව ඒ .ඩි .එස්. සදීකා මිය - ලේකම් ,පළාත් පාලන අමාත්‍යාංශය, බස්නාහිර පළාත ගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023 . 12.04 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය සේවා අවශ්‍යතාවය මත යැයි සඳහන් කරමින් වහාම ක්‍රියාත්මක වන පරිදි කොළඹ මහ නගර සභාව වෙත ස්ථාන මාරු කර ඇත .

එහෙත් මෙම පැමිණිලිකාරිය වයස අවුරුදු 58 ක් ඉක්ම වූ කාන්තාවක් බැවින් ඊට අදාල 2024 .05 .18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකක සමාජවාදී ජනරජයේ අංක 2384/44 දරන ගැසට් නිවේදනය බස්නාහිර පළාත් වාර්ෂික ස්ථාන මාරුකිරීමෙහි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති අනුව හිමිවිය යුතු රැකවරණය පැමිණිලිකාරිය වෙත හිමිවිය යුතු බවද නිරීක්ෂණය වේ .

එසේ වුවද පළාත් පාලන අමාත්‍යාංශය ලේකම් වෙත , හිටපු අමාත්‍ය හා පාර්ලිමේන්තු මන්ත්‍රී ,වත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති , හරීන් ප්‍රනාන්දු මහතාගේ වුමනාවක් මත පැමිණිලිකාරිය වෙත ස්ථාන මාරු කිරීමක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති 2023. 10 .09 දිනැති ලිපිය මත පදනම්ව ලේකම් , පළාත් පාලන අමාත්‍යාංශය පැමිණිලිකාරිය ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇති බවත්, පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්වරියගේ එම ක්‍රියා කලාපය නිසා පැමිණිලිකාරියගේ වන ආර් .එච් .ජී වසන්ති වික්‍රමරත්න මිය ගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12 වන ව්‍යවස්ථාව අනුව සැමට නීතියේ රැකවරණය ලැබීමේ අයිතිය උල්ලංඝනය වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය වෙත ලැබී ඇති එකී සේවා ස්ථාන මාරු කිරීම 2023. 12 .07 දින සිට 2024. 02 .12 දක්වා ක්‍රියාත්මක වී නොමැත.

තවද ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය , බස්නාහිර පළාතගේ අංක CMWP/ADM14/1/13/2022 හා 2023 . 12.04 දිනැති මත ස්ථානමාරු කිරීම් ලිපිය අනුව ක්‍රියාත්මක නොවී ඇති අතර පැමිණිලිකාරිය විසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත ස්ථාන මාරුව ලබාදෙන ලෙස ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත. පැමිණිලිකාරියගේ එකී ඉල්ලීම අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ පරිපාලන නිලධාරි තනතුරට ස්ථාන මාරු කර ඇති බව ද එහිදී, නිත්‍ය තනතුරට අමතරව එහි පුරප්පාඩුව පවතින නාගරික ලේකම් (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III) තනතුරෙහි වැඩබැලීම සඳහා පත් කිරීමටද (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණය යටත්ව) ලේකම්, පළාත පාලන අමාත්‍යාංශය අංක CMWP/ADM13/1/02/2024 හා 2024. 02. 22 දිනැති ලිපිය මගින් සිදු කර ඇත .

එසේම , පැමිණිලිකාරිය වෙත ක්‍රියාත්මක විනය පරීක්ෂණයේ අවසන් නිර්දේශය සැලකිල්ලට ගෙන ලේකම් ,පළාත් පාලන, බස්නාහිර අමාත්‍යාංශය පළාත ගේ අංක CMWP/ADM23/7/13 හා 2025.06.03 දිනැතිව ලිපිය අනුව පැමිණිලිකාරිය සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් වී ඇත.

එසේ වුවද පැමිණිලිකාරිය විශ්‍රම යාමට ආසන්න නිසාත් වත්තල ප්‍රාදේශීය සභාවෙහි පැමිණිලිකාරිය සේවය කළ කාලයේ කටයුතු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය සම්බන්ධ චෝදනා නගා පරීක්ෂණයකට නියමිත බව වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇති නිසාත් , සමස්ථ මෙම ක්‍රියාවලියේ සිදු වී ඇති කරුණු අනුවත් මේ අවස්ථාවේ වත්තල ප්‍රාදේශීය සභාව වෙත පැමිණිලිකාරිය නැවත ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කිරීමට මෙම කොමිෂන් සභාව අදහස් නොකරයි .

කෙසේ වෙතත් , මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැලැක්වීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ .

- බස්නාහිර පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්වරිය වන ඒ. ඩී .එස්. සදීකා මිය ගේ ක්‍රියාකලාපය නිසි පරිපාටිය හා ක්‍රමවේදයෙන් තොර එකක් බව නිරීක්ෂණය වන අතර රාජ්‍ය නිලධාරීන් නීතියට අනුකූලව විශේෂයෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා චක්‍රලේඛනයක් මගින් , රාජ්‍ය නිලධාරීන්හට අවධාරණය කිරීමට කටයුතු කිරීම සුදුසු බව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්වරයා වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දන්වා සිටිනු ලැබේ.

**2025 . 11 . 12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු .**

එල් .ටී. බී. දෙහිදෙණිය ,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික ) ,

සභාපති ,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මහාචාර්ය ටී.තනරාජ්,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Prof. T. Thanaraj
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත - 01. අමාත්‍ය ,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ,

නිදහස් චතුරසය ,

කොළඹ 07.